පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 09

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- පෙරදිග සංගීතය

පාසලේ නම : ..................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැ.2 යි

## I කොටස

- **01 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. රාග උත්පාදනය කිරීමේ ශක්තියක් ඇති ස්වර සැකසුම,

    I. මුඛ්‍යාංගය නමින් හඳුන්වයි. II. ජාති නමින් හඳුන්වයි.

    III. පල්ටා නමින් හඳුන්වයි. IV. ඨාට නමින් හඳුන්වයි.

02. රාගයක ලක්ෂණයක් **නොවන** ප්‍රකාශය තෝරන්න.

    I. ගායනය හා වාදනයට යොදාගනී.

    II. ස්වර හා ස්වර වර්ණ අඩංගු වේ.

    III. අසන්නාගේ සිත රංජනය කිරීමට සමත් වේ.

    IV. ස්වර හතම තිබිය යුතු වේ.

03. හින්දුස්ථානි සංගීත පද්ධතියේ ඇති රාග ජාති සංඛ්‍යාව කීයද ?

    I. 3 යි. II. 6 යි. III. 9 යි. IV. 10 යි.

04. වර්ජිත ස්වර සම්බන්ධයෙන් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

    I. අලංකාරය සඳහා යොදාගනී.

    II. රාගයේ සතුරු ස්වරය ලෙස හැඳින්වේ.

    III. රාගයක කිසිවිටක නොයෙදේ.

    IV. ජීව ස්වර ලෙස හැඳින්වේ.

05. ස්වර පමණක් අඩංගු රාග හා සම්බන්ධ ප්‍රබන්ධ විශේෂය,

    I. ලක්ෂණ ගී නමින් හඳුන්වයි.

    II. සර්ගම් නමින් හඳුන්වයි.

    III. මධ්‍යලය ගීත නමින් හඳුන්වයි.

    IV. ස්වර අභ්‍යාස නමින් හඳුන්වයි.

06. "ආදරයේ උල්පත වූ අම්මා" යන ගීතයේ තනු නිර්මාණය කර ඇත්තේ කුමන ජන නාදමාලාව ආශ්‍රයෙන්ද ?

    I. නෙළුම් ගී

    II. දරු නැළවිලි ගී

    III. ගොයම් ගී

    IV. පතල් ගී

07. "දොහොරා" ලක්ෂණ සහිතව ගැයෙන නූර්ති ගීතය ඇතුලත් වරණය තෝරන්න.

I. දැක්කොත් පද්මාවතී.	II. වාසනා දිනේකි මේක.

III. ලියමු මේ සිංහල භාෂාවෙන්.	IV. දන්න වංහුං අප කන්න ස්වාමී

08. "පාවෙන පීරිසියක් උඩ නැගලා , පහසුවටත් වාසියටත් , ඕවත් වැඩද මල්ලි " ආදී ගීත නිර්මාණය කළ සංගීත කණ්ඩායම කුමක්ද ?

I. ලාබම්බාස්

II. ත්‍රී සිස්ටර්ස්

III. මී මැස්සෝ

IV. ජිප්සීස්

09. ජප්තාලයට අනුව නිර්මාණය වී ඇති ගී පාදය තෝරන්න.

I. සසර වසන තුරු

II. ඇසේ මතුවන කඳුලු බිඳු ගෙන

III. මිදුලේ වැලි මාලිගාවේ

IV. රන්වන් කරල් සැලෙයි

10. G, B Flat , D යන ස්වර තුන එකතු වීමෙන් නිර්මාණය වන කෝඩ්එක කුමක්ද ?

I. G Major

II. D Major

III. G Minor

IV. F Minor

- **11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට තිත් ඉරිමත යෙදිය යුතු කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.**

11. බටහිර ස්වර ප්‍රස්තාරයක නිහඬ මාත්‍රා පෙන්වීමට යොදන සලකුණු ................ නමින් හඳුන්වයි.

12. ඩොටඩ් මිනිම් හි ( Dotted Minim ) වටිනාකම මාත්‍රා .................... කි.

13. ඇත කඳුකර හිමව් අරණේ ගීතය ................................ නාට්‍යයේ අඩංගු ගීතයකි.

14. .......................................................... යන ස්වර බිලාවල් රාගයේ අනුවාදී ස්වර වේ.

15. ............ සහ ............. යන ස්වර භූපාලි රාගයේ වර්ජිත ස්වර වේ.

- **16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට අදාල ප්‍රකාශ හරිනම් ( √ ) ලකුණද වැරදි නම් ( X ) ලකුණද ප්‍රශ්න අංකය යොදා ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.**

16. බටහිර ස්වර ප්‍රස්තාරයක ස්කේලය දැනවීමට යොදන සලකුණ key signatures නමින් හඳුන්වයි. (................)

17. G Major ස්කේලයේ Sharp ස්වර එකක් යෙදේ. .(.....................)

18. දැතට වළලු හා මල්සරා බැල්ම හෙලා , යන ගීත රාග ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගීත වේ. (.........................)

19. ට්‍රිබල් ක්ලෙෆ් සලකුණ F clef යනුවෙන් ද හඳුන්වයි.(.................)

20. ගිටාරය තත් 6 කින් සමන්විත භාණ්ඩයක් වේ. (.....................)	(2 x 20 = 40)

II කොටස

- **තෝරාගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. නිර්දේශිත රාග තුනකට අයත් තොරතුරු පහත වගුවේ දැක්වේ.එම තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | රාගය | ථාටය | ආරෝහණ | අවරෝහණ | ජාතිය | වාදී ස්වරය | සංවාදී ස්වරය |
|---|---|---|---|---|---|---|---|
| A | 1.............. | බිලාවල් | ස රි ග ම ප ධ නි ස් | 2................... | 3....... | 4......... | ග |
| B | 5.............. | 6.......... | ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> ස් | 7................... | 8....... | ප | ස |
| C | 9.............. | කල්‍යාණ | 10....................... | ස් ධ ප ග රි ස | 11..... | ග | 12....... |

I. 1 සිට 12 දක්වා හිස්තැන්වලට අදාල තොරතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අංක යොදා, අංක ඉදිරියෙන් ලියන්න. (ල.12 x 1/2 = 06)

II. A සහ B යන රාග දෙකෙන් කැමති රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ල. 04)

III. C රාගයට අදාළව ස්වර අභ්‍යාසයක් ආරෝහණ හා අවරෝහණ වශයෙන් ලියා දක්වන්න. (ල . 02)

02. A B C D යන ගී පාද ඇසුරින් පිළිතුරු සපයන්න.

A - ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා.

B - මිහි මඬලේ අඳුරු කුසේ

C - සොයා පිළිසරණක් ලොවෙන් මා

D - කම්හලේ පියස යට කඳුලු මල් පිබිදුනේ

I. A B C D අක්ෂර මගින් දක්වා ඇති ගීත නිර්මාණය වී ඇති හින්දුස්ථානි තාල හතර නම් කරන්න. (ල. 04)

II. C හෝ D යන ගීතයන්ට අදාල තාල දෙකෙන් එකක් ප්‍රස්තාර කර දක්වන්න. (ල. 04)

III. ඉහත නම් කරන ලද හින්දුස්ථානි තාල හතරට සමාන දේශීය තිත් හතර නම් කරන්න. (ල. 04)

03. බටහිර සංගීතයේ, සංගීත භාණ්ඩ කොටස් හතරක් යටතේ වර්ගකර තිබේ.

I. බටහිර සංගීත භාණ්ඩ වර්ගකර ඇති කොටස් හතර ලියා දක්වන්න. (ල. 04)

II. පහත දැක්වෙන සංගීත භාණ්ඩ එම කොටස් හතරට අදාලව වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.

Violin
Saxophone
Glockenspiel
Trumpet
Bass Drum
Clarinet
Guitar
Trombone

(8 X 1 = ල. 08)


04. ප්‍රශස්ති, වන්නම්, හටන් යනු මහනුවර යුගයේ කවිකාර මඩුව ආශ්‍රිතව ජනප්‍රිය වූ සේ ගී විශේෂ වේ.

I. ප්‍රශස්ති වන්නම් හටන් යන සේ ගී තුනෙන් එක් සේ ගී විශේෂයක් පිළිබඳ කරුණු 4ක් ලියා දක්වන්න. (ල. 04)

II. දේශීය සංගීත භාණ්ඩ (පංච තූර්ය භාණ්ඩ) වර්ග කර ඇති කොටස් පහ නම් කරන්න. (ල. 05)

III. ඉහත කොටස් පහෙන් කොටස් තුනකට අයත් භාණ්ඩ තුනක් නම් කරන්න. (ල. 03)

05. තෝරාගත් ගී තනු පාදයක අපර දිග ස්වර ප්‍රස්තාරය පහත දැක්වේ.




I. ඉහත අපරදිග සංගීත ස්වර ප්‍රස්තාර කොටසේ අංක 1 සිට 5 දක්වා සටහන් කර ඇති සංකේත නම් කරන්න. ( ල. 05 )

II. එම අපරදිග සංගීත ප්‍රස්තාර කොටස පෙරදිග සංගීත ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න. ( ල.04 )

III. ඉහත ප්‍රස්තාරය අයත් ස්කේලය (scale) නම් කර ඊට අයත් ආරෝහණ ස්වර බටහිර සංගීතයට අනුව ලියා දක්වන්න. ( ල. 03 )

06. A B C යන ප්‍රකාශවලින් සංගීත භාණ්ඩ තුනක් ගැන කියවේ. එම ප්‍රකාශ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A - ගීතයේ තනුව වයමින් Bass button මගින් රිද්මයට අනුව Chords (කෝඩ්ස්) වාදනය කරයි.

B - YAMAHA , ROLAND , KROG ආදී වෙළඳ නාමයන්ගෙන් නිර්මාණය වී ඇති අතර, එළිමහන් සංගීත කණ්ඩායම් අතර ඉතා ජනප්‍රිය භාණ්ඩයක් වේ.

C - අපරදිග සිට පෙරදිගට සංක්‍රමණය වූ සුළං ආධාරයෙන් හඬ නිපදවන මෙම භාණ්ඩය හැන්ඩ් බැලෝ , ෆුට් බැලෝ , සයිඩ් බැලෝ , එකෝඩියන් බැලෝ ආදී වශයෙන් වර්ග කීපයකි.

I. A , B , C යන අක්ෂරවලින් කියවෙන සංගීත භාණ්ඩ තුන නම් කරන්න. ( ල. 03 )
II. A සංගීත භාණ්ඩයට අයත් වෙනත් කරුණු දෙකක් ලියා දක්වන්න. ( ල. 02 )
III. B සංගීත භාණ්ඩයේ සුවිශේෂතා දෙකක් ලියා දක්වන්න. ( 2 X 2 = ල. 04 )
IV. C සංගීත භාණ්ඩය වාද්‍ය භාණ්ඩයක් ලෙස භාවිතා කරන ගී විශේෂ තුනක් ලියා දක්වන්න. ( ල. 03 )

07. පහත දැක්වෙන මාතෘකා අතරින් මාතෘකා **තුනක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය.
II. Sharp / Flat / Natural Marks
III. ගිටාරය
IV. සංගීත ප්‍රසංගයකදී යොදාගන්නා තාක්ෂණික මෙවලම්
V. විවාදී ස්වර ( 4 X 3 = ල. 12 )


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න